**ශීර්ෂය 149 – කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව |
| 297 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව |
| 299 | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය |
| 303 | පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.964,056,559 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,802,167,741 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.2,197,728 ත් රු.936,016,957 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4 ත් සියයට 41 ත් අතර පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 149 | 2,283,700,000 | 1,347,683,043 | 936,016,957 | 41 |
| 295 | 107,401,000 | 101,608,156 | 5,792,844 | 5 |
| 297 | 28,550,000 | 26,352,272 | 2,197,728 | 8 |
| 299 | 20,925,000 | 12,902,075 | 8,022,925 | 38 |
| 303 | 325,648,300 | 313,622,195 | 12,026,105 | 4 |
| **එකතුව** | **2,766,224,300** | **1,802,167,741** | **964,056,559** | |

## 2.2 ආදායම් ගිණුම්

### ඇස්තමේන්තගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක් විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේත දෙකක් සඳහා එකතුව රු.මිලියන 105 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 141 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 37 කින් හා සියයට 39 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු. | රු. | රු. | |
| 20.03.02.10 | 100,000,000 | 134,005,630 | 34,005,630 | 34 |
| 20.03.02.12 | 5,000,000 | 6,966,000 | 1,966,000 | 39 |
| එකතුව | 105,000,000 | 140,971,630 | 35,971,630 | 34 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

## 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු පහකට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 14901 | 12,000,000 | 7,291,800 | 8,000,000 | 9,484,464 | 55,000,000 | 36,721,676 |
| 29501 | 5,000,000 | 4,850,459 | 2,000,000 | 4,011,411 | 20,000,000 | 13,688,253 |
| 29701 | 4,500,000 | 3,110,161 | 2,100,000 | 2,905,947 | 32,000,000 | 12,051,295 |
| 29901 | 3,500,000 | 2,000,615 | 1,200,000 | 2,273,248 | 13,000,000 | 5,014,160 |
| 30301 | 5,500,000 | 4,159,114 | 3,200,000 | 3,382,448 | 32,000,000 | 17,350,659 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.68,489,696 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 6000/0000/000/0015/0060/000 | 64,264,164 |
| සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0152/000 | 60 |
| පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0158/000 | 4,225,472 |
| එකතුව | | 68,489,696 |

## 2 කොටස

----------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

---------------------------------------------------

### 1. ශීර්ෂය 149 - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

#### 1.1 විගණන විෂය පථය

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

#### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත්වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයන් 12 ක් සඳහා සළසා තිබුණු රු.237,525,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- වැය විෂයයන් 27 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 04 දෙනෙකුට අවස්ථා 12 කදී එකතුව රු.218,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

- මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිමවී දින 11 ත් දින 55 ත් අතර කාලයක ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණි.

### (ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 14901 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.105,532 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

**1.4 කාර්යසාධනය**

------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් මූල්‍ය හා භෞතික ප්‍රගතියක් පෙන්නුම් නොකරන ව්‍යාපෘති**

------------------------------------------------------------------------------------

**(i)** ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ සහතික ලබාදීමේ වැඩසටහන (Food Safety & hygiene certification programme) වෙනුවෙන් 2013 වර්ෂය සඳහා රු.මිලියන 4 ක ප්‍රතිපාදන සළසා තිබුණද ඉන් රු. මිලියන 0.47 ක් උපයෝජනය කර තිබුණු අතර එය සළසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක් වී තිබුණි. එසේම ළඟා කරගත් භෞතික ප්‍රගතිය කොපමණද යන්න තහවුරු කරගැනීමට ප්‍රමාණවත් ලිඛිත තොරතුරුද පවත්වා නොතිබුණි.

**(ii)** රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා 30 දෙනෙකු පුහුණු කිරීමට රු.මිලියන 2 ක් වැය කිරීමට අපේක්ෂා කළද පුහුණුව සඳහා 15 දෙනෙකු පමණක් තෝරාගෙන ඒ වෙනුවෙන් රු.මිලියන 0.26 ක් හෙවත් අපේක්ෂිත මුදලින් සියයට 13 ක් පමණක් වැයකර තිබුණි.

**(iii)** පාවහන් හා භාණ්ඩ නිෂ්පාදන පුහුණු ආයතනයක් ගොඩනැගීම වෙනුවෙන් රු. මිලියන 50 ක ප්‍රතිපාදන සළසා තිබුණද ඉන් රු.මිලියන 14.15 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 28 ක් උපයෝජනය කර තිබුණි. වැයකරන ලද වටිනාකමට අදාල භෞතික ප්‍රගතිය නිසි පරිදි අධීක්ෂණය කළ බව විගණනය වෙත තහවුරු කිරීමට කළමනාකාරිත්වය අපොහොසත්වී තිබුණි.

**(iv)** සම් ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධව රු.මිලියන 90 ක ප්‍රතිපාදන සළසා තිබුණද, ඉන් රු.මිලියන 2 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සියයට 97 කට අදාලව මූල්‍ය හෝ භෞතික කාර්යසාධනයක් ලඟාකර ගෙන නොතිබුණි.

**(ආ) කිසිදු ප්‍රගතියක් පෙන්නුම් නොකරන ව්‍යාපෘති**

------------------------------------------------------------

**(i)** 2013 වර්ෂය තුළදී කොහු පරීක්ෂණාගාරයක් හා ඊට අදාල මෙවලම් සඳහා රු.මිලියන 5 ක් ද සංවර්ධන අංශ II යටතේ අච්චු හා තෙරපුම් කර්මාන්තය සඳහා රු.මිලියන 5.26 ක් ද වශයෙන් එකතුව රු. මිලියන 10.26 ක ප්‍රතිපාදන සළසා තිබුණද, ඉන් කිසිදු ප්‍රගතියක් ලඟාකරගෙන නොතිබුණි.

"කොහු පර්යේෂණාගාරයක් හා ඊට අදාල මෙවලම් " ව්‍යාපෘතිය පොල් සංවර්ධන අධිකාරිය හරහා ඉටුවන බැවින්ද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම නිසා අච්චු හා තෙරපුම් ව්‍යාපෘතියද අත් හිටුවීමට සිදුවූ බව කළමණාකාරිත්වය විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) ලෝහ නිෂ්පාදන හා යන්ත්‍රෝපකරණ කර්මාන්තය වෙනුවෙන් රු. මිලියන 2 ක ප්‍රතිපාදන සළසා තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි. පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව පැවති බැවින් යන්ත්‍රෝපකරණ වෙළඳ ප්‍රදර්ශනය අවලංගු කළ නිසා මෙම තත්ත්වය ඇතිවූ බව කළමණාකාරිත්වය විසින් විගණනය වෙත දන්වා තිබුණි.

**1.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 38 | 17 |
| තෘතියික මට්ටම | 12 | 08 | 04 |
| ද්විතීයක මට්ටම | 1,087 | 593 | 494 |
| ප්‍රාථමික මට්ටම | 99 | 88 | 11 |
| එකතුව | 1,253 | 727 | 526 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 526 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**2. ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුව**

**2.1 විගණන විෂය පථය**

වාණිජ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 27 දින වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වාණිජ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6.3 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සාමාජික ණය ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ආ) **අයවැය විචලනය**

වැය විෂයයන් 06 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ත් සියයට 95 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 29501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.38,650 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) විදේශ තානාපති කාර්යාලවලට අනුයුක්ත කරන ලද වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ එකතුව රු.2,472,334 ක් වූ ණය ශේෂ, ණය වර්ගය අනුව අත්තිකාරම් ගිණුම්වල දක්වා නොතිබුණි.

(iii) ආපදා ණය ලබා ගැනීම සඳහා නිලධාරීන් විසින් ඉදිරිපත් කළ අයදුම්පත් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු බව නියැදි විගණන පරික්ෂාවේදී අනාවරණය විය.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2013 වර්ෂයට අදාළව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී වගකීම් දැරිය යුතු නිලධාරීන් පිළිබඳ විස්තර දක්වා නොතිබුණි. එසේම තෝරාගත් නිෂ්පාදන ප්‍රවර්ධනය, නව නිෂ්පාදන හඳුන්වාදීම, අපනයන ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලැසීම, කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ කර්මාන්තකරුවන් නැංවීම හා ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා වෙළඳපල නිර්මාණය

කිරීම වැනි අංශ කෙරෙහි අවධානය යොමු කරන බව ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණද, ඒ සඳහා වන සැලැසුම්ගත ඉලක්ක දක්වා නොතිබුණි.

**2.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා**

-------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

2.5 **බේරුම් නොකළ බැරකම්**

--------------------------

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 1 ට අඩු බැරකම් රු.1,993,183 ක් විය.

2.6 **කාර්යසාධනය**

------------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව ආයතනයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) අපනයන ප්‍රවර්ධනය**

-------------------------

දිවයිනේ අපනයන ප්‍රවර්ධනය වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන අතර, 2013 වර්ෂයේ දිවයිනේ සමස්ථ අපනයන වටිනාකම 2012 වර්ෂයට සාපේක්ෂව ඇ.එ.ජ.ඩොලර් මිලියන 9,180 සිට ඇ.එ.ජ.ඩොලර් මිලියන 10,009 දක්වා වැඩි වී තිබුණි. 2011 වර්ෂයේදී එහි වටිනාකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 10,017 ට සාපේක්ෂව අඩු වී තිබුණි. මේ අනුව ශ්‍රී ලංකාවේ අපනයන ආදායම අඛණ්ඩව වර්ධනය කිරීමේ ක්‍රියාකාරී වැඩපිළිවෙලක අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ) ණය දෙන ආයතන අනුමත කිරීම**

--------------------------------------

1949 අංක 6 දරන උකස් පනත අනුව, 1947 අංක 12 දරන භාරකාර ආඥා පනත සහ 1990 අංක 14 දරන දේශිය භාර ලදුපත් පනත යටතේ වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයාට

(i) ණය දෙන ආයතන අනුමත කිරීම හා ලියාපදිංචි කිරීම.

(ii) අනුමත ණයදෙන ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳව අධීක්ෂණයක් සිදු කිරීම

පැවරී තිබුණි. නමුත් ඉහත කාර්යන් ඉටු කිරීමට දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ඇ) නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ නිකුත් කිරීම**

2013 වර්ෂයේදී වාණිජ දෙපාර්තමේන්තුව විසින් සේවයේ නියුක්ත කරනු ලබන ප්‍රවාසිකයන් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත් කිරීමේ බලයලත් ආයතනය ලෙස නිර්දේශ 206 ක් නිකුත් කර තිබුණි. කෙසේ නමුත් මෙම නිර්දේශයන් ලබාදීමේදී විදේශිකයන් ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූල වූ ව්‍යාපාර කටයුතුවල නිරතවීම පිළිබඳව සොයා බලන පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් ඉටුකර නොතිබුණි.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 54 | 51 | 03 |
| තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| ද්විතියික මට්ටම | 64 | 47 | 17 |
| ප්‍රාථමික මට්ටම | 19 | 12 | 07 |
| **එකතුව** | **139** | **111** | **28** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 28 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) පුරප්පාඩුව පවතින තනතුරු අතර වාණිජ අධ්‍යක්ෂ තනතුරු එකක්ද, සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුරු දෙකක් හා වාණිජ පර්යේෂණ සහකාර තනතුරු හතරක්ද විය. ජ්‍යෙෂ්ඨ

මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩු දෙපාර්තමේන්තුව තුළ තිබියදීත්, දෙපාර්තමේන්තුවෙන් වැටුප් ලබන නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ තනතුරු දරන නිලධාරීන් දෙදෙනෙකු අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි.

(ඇ) පද්ධති විශ්ලේෂක හා භාෂා පරිවර්තක යන තෘතියික මට්ටමේ තනතුරු 02 ක් තනතුර ඇති කළ දින සිට පුරප්පාඩුව පැවැති අතර, පුස්තකාලයාධිපති තනතුරද වසර 15 ක කාලයක සිට පුරප්පාඩුව පවතින බව අනාවරණය විය.

## 3. ශීර්ෂය 297- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

### 3.1 විගණන විෂය පථය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 11 දින සමාගම් රෙජිස්ට්‍රාර් (රාජකාරී ඉටු කිරීම්) වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත්

කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**3.3 විගණන නිරීක්ෂණය**
---------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **අයවැය විචලනය**
-------------------

වැටුප් හා වේතන වැය විෂය සඳහා අධිප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.2,171,137 ක් වි තිබුණි. එය එම වැය විෂය සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් වී තිබුණි.

(ආ) **ආදායම් ගිණුම්**
-----------------

ආදායම් සංකේත 2 කට අදාල ආදායම් ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආදායම් සංකේත 20.03.02.10 යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.70,000,000 ක ආදායමක් රැස්කිරිමට අපේක්ෂා කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ආදායම් ඇස්තමේන්තුව රු.100,000,000 ක් ලෙස සංශෝධනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදි එම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.34,005,630 කින් හෙවත් සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 34 කින් ඉක්මවා රු.134,005,630 ක ආදායමක් රැස්කර තිබුණි.

(ii) එසේම ආදායම් සංකේත 20.03.02.12 යටතේ සමාලෝචිත වර්ෂයේදී රු.5,000,000 ක ආදායමක් රැස්කිරිමට අපේක්ෂා කර තිබුණද, තථ්‍ය ආදායම රු.6,474,000 ක් වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම රු. 1,474,000 ක් හෙවත් සියයට 29 කින් වැඩි වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 29701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.120,741 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණු අතර, වර්ෂ 11 ත් වර්ෂ 30 ත් අතර දීර්ඝ කාල පරාසයක සිට එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ii) 2005 වර්ෂයේදී විශ්‍රාම ගිය සහ වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් පිළිවෙලින් රු.72,260 ක් හා රු.17,000 ක ණය ශේෂයන් අයවිය යුතුව තිබුණද, දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 8 ඡේදය ප්‍රකාරව, දෙපාර්තමේන්තුව විසින් ණය ලේඛන සහ පොත්පත් විධිමත්ව පවත්වා නොතිබුණි.

## 3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එහි කාර්යයන් විස්තරාත්මකව සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන්නන් පිළිබඳ විස්තර හා අදාළ කාර්යයන් ඉටු කිරීමේ කාලවකවානුද නිශ්චිතව දක්වා නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුව සතු වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුව සතුව වාහන තුනක් පැවැතියද, ඒ සඳහා රියදුරන් දෙදෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. මේ නිසා දිගු කාලයක සිට එක් වාහනයක් ඌන

උපයෝජිතව පැවතුණි. එසේම ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ රියදුරු තනතුරු 03 ක් පැවතියද, එයින් එක් තනතුරක් දිගු කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) **පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

---------------------------------------------------------

දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල පිහිටි ඉඩම, ප්‍රවාහන අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත පවරා ගැනීම සඳහා 2007 සැප්තැම්බර් 12 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් මේ වෙනුවෙන් 2012 ජුනි 26 දින රු.35,510,750 ක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. නමුත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ඉඩම දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණි.

3.6 **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

------------------------------------------------------------------

**ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන**

------------------------------------

සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 140 ක ප්‍රතිපාදන සළසා තිබුණද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබීම නිසා සළසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඌන උපයෝජිත වී තිබුණි. මීට අමතරව පරිපාලන වියදම් සඳහා තවත් රු.2,800,000 ක අතිරේක ප්‍රතිපාදනයක් සළසා තිබුණු අතර ඉන් රු.1,086,000 ක් පරිගණක සහ ඊට අදාල මෘදුකාංග මිලදී ගැනීම සඳහා පමණක් වියදම් කර තිබුණි.

3.7 **කාර්යසාධනය**

------------------

දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **සමාගම් සහ අනෙකුත් ලියාපදිංචි කිරීම්**

---------------------------------------------

දෙපාර්තමේන්තුවේ භෞතික කාර්යසාධනය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී පහත සඳහන් පරිදි අඩු වී තිබුණි.

| | සංඛ්‍යාව | | වෙනස අඩුවීම | අඩුවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2013 | 2012 | | |
| ලියාපදිංචි කළ සමාගම් | 6,047 | 7,089 | (1,042) | (15) |
| ගොනු පරීක්ෂා කිරීම් | 10,847 | 12,729 | (1,882) | (15) |
| නාම අනුමත කිරීම | 12,075 | 14,194 | (2,119) | (15) |
| සහතික කළ පිටපත් | 36,531 | 38,459 | (1,928) | (5) |
| ආකෘති පත්‍ර ලියාපදිංචි කිරීම | 70,659 | 74,304 | (3,645) | (5) |
| වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම | 29,853 | 33,845 | (3,992) | (12) |
| මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම | 2,867 | 2,959 | (92) | (3) |
| ආකෘති පත්‍ර විකිණීම | 4,207 | 4,368 | (161) | (4) |
| ලේකම්වරුන් ලියාපදිංචි කිරීම | 437 | 622 | (185) | (30) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී, වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම්, 2012 වර්ෂයට සාපේක්ෂව 3,992 කින් හෙවත් සියයට 12 කින් අඩු වී තිබුණද, ආදායම රු. මිලියන 29 සිට රු. මිලියන 149 ක් දක්වා වැඩි වී තිබුණි. එසේම අනෙකුත් සියලුම ඒකකයන්ගේ කාර්යසාධනයේ ප්‍රගතිය භෞතිකව අඩු වී තිබුණද, ආදායම වැඩි වී තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේ ගාස්තු ඉහළ දැමීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ii) 2007 අංක 7 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව 2013 දෙසැම්බර් 31 දින වන විට සමාගම් 62,508 ක ප්‍රමාණයක් ලියාපදිංචි කර තිබුණි. ඉන් 2013 දෙසැම්බර් 31 දින දක්වා වාර්ෂික වාර්තා ගොනු කළ යුතු සමාගම් ගණන 52,990 කින්, සමාගම් 38,906 ක් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු.64,843,333 ක් ආදායම් අයකර ගෙන නොතිබුණි. එසේම වාර්ෂික වාර්තා ගොනු නොකළ සමාගම්වලින් වාර්ෂික වාර්තා ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටු කර නොතිබුණි.

## (ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) 2007 අංක 7 දරන සමාගම් පනත ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------------------------

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට සමාගම් පනතෙන් පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යයන් අතර ලියාපදිංචි සමාගම්වල කටයුතු නියාමනය කිරීම දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු කාර්යයක් විය. දෙපාර්තමේන්තුව විසින් එය ඉටු කිරිම සඳහා ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් දුර්වලතාවන් නිරීක්ෂණය විය.

- සීමිත සමාගමක් ස්ථාපිත කර දින 30 ක් ඇතුළත සමාගමේ නම, අංකය, ලියාපදිංචි කාර්යාලය, ලිපිනය නිශ්චිතව සඳහන් කරමින් සමාගම සංස්ථාගත කළ බවට ප්‍රසිද්ධ දැන්වීමක් පල කළ යුතු විය. එසේ කටයුතු නොකළ සීමිත සමාගම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් 2007 අංක 4 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
- සීමිත සමාගම්වල ආරම්භක කොටස් නිකුතුව සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා දැනුවත් කර නොතිබීම සහ එවැනි සීමිත සමාගම් සම්බන්ධයෙන් සමාගම් පනතේ 51 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ සීමිත පෞද්ගලික සමාගම් නොවන සීමිත සමාගම් සම්බන්ධව පනතේ 170(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.
- සමාගම්වල නාමය වෙනස් කිරීම සම්බන්ධව සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකළ සීමිත සමාගම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
- වාර්ෂික වාර්තා ඉදිරිපත් නොකළ සීමිත සමාගම් සම්බන්ධව සමාගම් පනතේ 131(4) වගන්තිය ප්‍රකාර කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර ඒවායේ නාමය කපා හැරීමට කටයුතු කර නොතිබුණි.
- ක්‍රියාකාරී නොවන සීමිත සමාගම් රාශියක් තිබුණි.
- පෙර වර්ෂවල වාර්ෂික වාර්තා ගොනුකර නොතිබුණු අතර ඊට පසු වර්ෂවල වාර්ෂික වාර්තා ගොනු කර තිබුණි.

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 102 (1) වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ සීමිත සමාගම් විසින් ඇති කරනු ලැබූ සෘණ භාර ලියාපදිංචි කළ යුතු වුවද, එම ක්‍රියාවලියේ විශාල ප්‍රමාදයන් පැවැතුණි.

**(ii) 1935 අංක 61 දරන සීට්ටු ආඥා පනත**

සීට්ටු ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීමේ කාර්ය භාරය සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට පවරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මේ යටතේ කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි. මේ පිළිබඳව විමසීමේදී මීට පිළිතුරු ලෙස මෙම පනත දැනට අක්‍රීය මට්ටමකින් පවතින බව දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා තිබුණි.

**(iii) සමිති ආඥා පනත**

සමාලෝචිත වර්ෂයේදී, සමිති ආඥා පනත යටතේ සමිති 169 ක් ලියාපදිංචි කර තිබූ අතර, සමිති ලියාපදිංචියෙන් ලැබූ මුද්දර ආදායම රු. 4,225 ක් විය. 2010 වර්ෂය හා 2013 වර්ෂය අතර, කාලසීමාව තුළ ලියාපදිංචි කරන ලද සමිති සංඛ්‍යාවේ අඛණ්ඩ අඩුවීමක් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය සියයට 75 දක්වා අඩු වී තිබුණි.

**(iv) පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම**

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ විධිවිධාන අනුව රු. මිලියන 5 ක් ඉක්මවන සියලුම කොන්ත්‍රාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි කළ යුතු අතර, සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පොදු කොන්ත්‍රාත් 4,251 ක් ලියාපදිංචි කර තිබූ අතර, 2012 දී එය 4,414 ක් විය. 2012 වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේදී එහි සියයට 4 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

**(v) විගණකයින් ලියාපදිංචිකිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම**

සමාලෝචිත වර්ෂයේදී නව විගණකවරුන් 74 දෙනෙකු අලුතෙන් ලියාපදිංචි වී තිබූ අතර, ඉන් ලද ආදායම රු.9,900 ක් විය. පසුගිය වර්ෂයේදී අලුතෙන්

ලියාපදිංචි වූ විගණකයින් 84 දෙනෙකුගෙන් ලැබූ ආදායම රු. 11,340 ක් වූයෙන් ලද ආදායම සියයට 12 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී, විගණකයින් ලියාපදිංචිය අලුත් කිරීම 556 ක් වූ අතර, ආදායම රු.12,232 ක් විය. එය පසුගිය වර්ෂයේ දී 444 දෙනෙකු වූ අතර ආදායම රු.9,768 ක් වූයෙන් ආදායම සියයට 25 කින් වැඩි වී තිබුණි. තවද විගණකවරුන් නියාමනය හා දැනුවත් කිරීම සම්බන්ධයෙන් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.8 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2007 අංක 1 දරන සමාගම් පනතේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද සියලුම වියදම් අරමුදලින් දැරිය හැකි වුවත්, එම වියදම් යටතට නොගැනෙන, පෞද්ගලික සමාගමකට අයත් කොටස් මිලදී ගැනීම සඳහා රු. 90,275,000 ක් වැයකර තිබුණි. මෙම කොටස්වල අයිතිය සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට හිමි වී තිබූ අතර, අදාල සමාගම බුන්වත්වීම නිසා එය ඇවර කිරීමට තීරණය කර තිබුණි. තවද මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් දෙපාර්තමේන්තුවට 2013 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි.

3.9 **අනාර්ථික ගනුදෙනු**

පුරප්පාඩු වී ඇති සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා 2012 වර්ෂයේ සිටම 2014 වර්ෂය දක්වා අවස්ථා කිහිපයකදී අයදුම්පත් කැඳවීම සිදුකර ඒ සඳහා වූ දැන්වීම් සඳහා රු.330,870 ක් වැයකර තිබුණි. එම තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු 2013 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගෙන නොතිබූ හෙයින් අදාල වියදම නිෂ්කාර්ය වී තිබුණි.

3.10 **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාගම් අරමුදලේ බැංකු ගිණුමෙහි 2013 වර්ෂයේදී රු. මිලියන 13 ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් අතිරික්තව පැවති අතර, එම මුදල් ඵලදායි ලෙස ආයෝජනය කර නොතිබීම නිසා ලබා ගත හැකිව තිබූ පොලී ආදායම අහිමි වී තිබුණි.

(ii) 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී, දෙපාර්තමේන්තුවේ

ලේඛනාගාරය මඟින් සිදුකරන ප්‍රධාන කාර්යයන් මානව සම්පත් හිඟය නිසා විධිමත් පරිදි පවත්වා ගෙන යා නොහැකි වී තිබුණි.

(iii) දැනට දෙපාර්තමේන්තුව විසින් තනි කොටස්කරුවන් සඳහා සීමිත පෞද්ගලික සමාගම් ලියාපදිංචි කිරීම් සිදු කළද, සමාගම් පනතේ ඒ බව පැහැදිලිව දක්වා නොමැති නිසා සමාගම් පනතේ අදාල වගන්තිය සංශෝධනය කළ යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් සමාගම් පනත සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 06 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 71 | 48 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 19 | 05 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | | | |
| | එකතුව | 107 | 75 | 32 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සහ සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරු යන තනතුරු දෙකම සඳහා රාජකාරී ඉටු කිරීමට පමණක් නිලධාරීන් දෙදෙනෙකු පත් කර තිබුණි.

(ii) එසේම, ව්‍යාපාර විශ්ලේෂණ සහකාර අනුමත තනතුරු 8 ක් සහ රාජ්‍ය20කළමනාකරණ සහකාර තනතුරු 10 ක් පුරප්පාඩු වී තිබුණි.

(iii) දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂක තනතුරු 4 න් තනතුරු 3 ක් පුරප්පාඩු වී තිබුණි. මේ අනුව තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට ඉහළ කළමනාකාරීත්වය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, මෙම

තත්ත්වය 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමට සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් කාර්යන් ක්‍රියාත්මක කිරීම සඳහා අහිතකර ලෙස බලපා තිබුණි

**4. ශීර්ෂය 299 - ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය**

---

**4.1 විගණන විෂය පථය**

---

ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 04 දින බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**4.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **අයවැය විචලනය**

වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක් හා සියයට 43 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 29901 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂ අතරින් එකතුව රු.139,410 ක්වූ වර්ෂ 4 කට වැඩි හිඟහිටි ශේෂ අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර, එම කටයුතු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයට පවරා තිබුණි. එම ඒකකය ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර 2013 සහ 2014 වර්ෂ සඳහා එක් විගණන විමසුම බැගින් නිකුත් කර තිබුණි.

4.5 **වත්කම් කළමනාකරණය**

**පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

බුද්ධිමය දේපළ ආශ්‍රිත අයිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් 2007 සැප්තැම්බර් 25 දිනැති අංක ටී.එම්.ඩී.සී/2007/25 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා සුරක්ෂිතාගාරයක්, අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් හා පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ

වෙනුවෙන් 2008 හා 2009 වර්ෂවලදී එකතුව රු.22,978,101 ක් වැයකර තිබුණු අතර 2011 ජනවාරි 31 දිනැති අංක අමප/11/037/503/013 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව එම ඉඩම සංචාරක කර්මාන්ත ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමට නියමිත බවත් ඒ සඳහා වෙනත් ස්ථානයක් හඳුනා ගන්නා ලෙස දන්වා තිබුණි. ඒ අනුව එහි ඉදිකිරීම් කටයුතු 2010 මාර්තු 31 දින නවතා තිබූ අතර වෙනත් ස්ථානයක් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමි භාගයක පිහිටි මෙම අදාල ඉඩමේ අයිතිය සහ පැවැත්ම තහවුරු කර නොගෙන අදාළ ඉදිකිරීම් කටයුතු සඳහා ඉහත මුදල් වැයකර තිබුණි. එම ඉඩමට සතොස ආයතනය විසින් සිය අයිතිවාසිකම් ඉදිරිපත් කර තිබීම හේතුවෙන් ආයතනය විසින් වැය කර තිබුණු රු.22,978,101 ක මුදල නිෂ්කාර්ය වී තිබුණි. වර්තමානයේදී ගොඩනැගිල්ල සුන්බුන් අගයට විකිණීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවැතිණි.

## 4.6 කාර්යසාධනය

------------------

සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලැසුම් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ කාර්යසාධනය පිළිබඳ තොරතුරු පහත සටහනෙහි දැක්වේ.

| | වෙළඳ ලකුණු ලියාපදිංචිය | පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය | කාර්මික සැලැසුම් ලියාපදිංචිය |
|---|---|---|---|
| පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 28,720 | 1,525 | 963 |
| වර්ෂය තුළ ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 8,825 | 516 | 346 |
| වර්ෂය තුළ කටයුතු කළ යුතු සංඛ්‍යාව | 37,545 | 2,041 | 1,309 |
| වර්ෂය තුළ ලියාපදිංචි කළ සංඛ්‍යාව | 1,485 | 236 | 130 |
| ඉදිරි වර්ෂයට ගෙන ගිය ලියාපදිංචි නොකළ සංඛ්‍යාව | 36,060 | 1,805 | 1,179 |
| කෙරීගෙන යන ලිපිගොනු සංඛ්‍යාව | 16,400 | 1,730 | 729 |
| කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් ලිපිගොනු | 19,660 | 75 | 450 |
| කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් ඉල්ලුම්පත්වල ප්‍රතිශතය | 52 | 4 | 35 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු මුළු ඉල්ලුම්පත්වලින් 2013 දෙසැම්බර් 31 දිනට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව 19,660 ක් වූ අතර, එය වර්ෂය තුළ ලියාපදිංචි කිරීමට ලැබී තිබූ 37,545 ක් වූ මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාවෙන් සියයට 52 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කිරීමට තිබූ මුළු පේටන්ට් බලපත්‍ර 2,041 කින් ඉල්ලුම්පත්‍ර 236 ක් ලියාපදිංචි කර තිබූ අතර කෙරීගෙන යන සංඛ්‍යාව 1,730 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් ලිපිගොනු සංඛ්‍යාව 75 ක් වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 4 ක් විය.

(ඇ) පසුගිය වර්ෂවලින් ඉදිරියට ගෙනා කාර්මික සැලැසුම් අයදුම්පත් 963 ක් සහ සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු අයදුම්පත් 346 ක් වශයෙන් එකතුව අයදුම්පත් 1,309 ක් සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කිරීමට තිබූ අතර, ඉන් ඉල්ලුම්පත් 130 ක් ලියාපදිංචි කර තිබුණු අතර එය මුළු ප්‍රමාණයෙන් සියයට 10 ක් පමණක් විය. අඩක් නිමකර තිබූ සංඛ්‍යාව 729 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දින වන විට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් කාර්මික සැලැසුම් අයදුම්පත් 450 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි වී තිබුණි.

(ඈ) වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලැසුම් ලියාපදිංචිය ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ප්‍රධාන කාර්යය වුවද, එම කාර්ය ඉටුකිරීමේ දී ඉහත සඳහන් පරිදි ප්‍රමාදවීම් පැවතීම හේතුවෙන් නව නිර්මාණකරුවන් අධෛර්යට පත්වීම සහ නිර්මාණකරුවන්ගේ නව නිර්මාණ තුළින් ආර්ථිකයට වන දායකත්වය නොලැබී යා හැකි බව නිරීක්ෂණය විය. ප්‍රමාද වූ ඉහත ඉල්ලුම්පත් කඩිනමින් ලියාපදිංචි කිරීමට 2013 මැයි මස සිට කැලි පදනම මත ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දී තිබුණු අතර ඒ සඳහා වූ රු.305,960 ක අමතර වියදමක් අරමුදලෙන් කර තිබුණි.

4.7 **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

---

**වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

---

නියැදි පරීක්ෂාවේදී අනාවරණය වු ක්‍රියාකාරී සැලැස්මට අනුකූල නොවූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව බුද්ධිමය දේපළ පහසුකම් සැපයීමේ මධ්‍යස්ථාන 3 ක් පිහිටුවීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම මධ්‍යස්ථාන පිහිටුවා නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 1.52 ක් ප්‍රතිපාදන සළසා ගෙන සරප්ගේ කාර්යභාරයන් පරිගණකගත කිරීමට හා අභ්‍යන්තර විද්‍යුත් තැපැල් ක්‍රමයක් හඳුන්වාදීමට සැලැසුම් කර තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම අරමුණ කරා ළඟාවීමට අපොහොසත් වී තිබුණි. මේ සඳහා සළසා තිබු ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1.125 ක් වැයකර පරිගණක උපාංග පමණක් මිලදී ගෙන තිබුණි.

4.8 **මානව සම්පත් කළමනාකරණය**

---

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

---

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 03 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 43 | 24 | 19 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 10 | 01 |
| | එකතුව | 64 | 40 | 24 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බුද්ධිමය දේපළ කාර්යාලයේ ප්‍රධාන තනතුර වන බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් තනතුර වසර 01 යි මාස 03 ක කාලයක සිට පුරප්පාඩුව පවතින අතර එම පුරප්පාඩුව පිරවීමට කටයුතු නොකර වැඩ බැලීමේ පදනමට නිලධාරිනියක් පත්කර තිබුණි. ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 02 ක් වසර 4 ½ ක කාලයක සිටද සහකාර අධ්‍යක්ෂ තනතුරක් වසර 2 ½ ක කාලයක සිටද පුරප්පාඩුව පැවැතුණි.

(ii) අරමුදලට සුවිශේෂ වූ තනතුරු අතරින්, බුද්ධිමය දේපළ තාක්ෂණික සහකාර, බුද්ධිමය දේපළ පර්යේෂණ සහකාර, ලේඛන හා දත්ත සහකාර සහ බුද්ධිමය දේපළ නිලධාරී යන තනතුරු 12 ක් පුරප්පාඩුව පැවැතුණි.

(iii) රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 06 ක්ද වසර 2 ක කාලයක් සිට පුරප්පාඩුව පැවැතුණි.

**5. ශීර්ෂය 303 - පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව**

**5.1 විගණන විෂය පථය**

පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 11 දින පේෂ කර්මාන්ත අධ්‍යක්ෂ වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**5.3 විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 07 කට අධිප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිවිම් සළසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 12 සිට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) වැය විෂයයන් 07 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.1,133,035 ක බැරකම්වලට එළඹ තිබුණි

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 30301 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව

රු.637,231 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම යටතේ දේපල ණය මුදලක් ලබාගත් නිලධාරිණියක් 2003 වර්ෂයේදී මිය ගොස් තිබුණු අතර, ඒ වන විට අය කර ගත යුතුව තිබුණු ණය ශේෂය රු.108,465 ක් වී තිබුණි. එම ණය මුදල ප්‍රදානය කර වසර 10 කට අධික කාලයක් ගත වි තිබුණත්, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම ණය ශේෂය අයකර ගැනීමට අපොහොසත් වි තිබුණි. එම දේපළ ණය ගෙවීමේදී ඇටෝර්නි බලය ලියාපදිංචි කර නොතිබුණ අතර, අදාල ඉඩමේ ඔප්පුවද දෙපාර්තමේන්තුව භාරයට ගෙන නොතිබුණි.

(iii) විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු ණය ශේෂ එකතුව රු.528,766 ක් වී තිබුණි. එම ණය ශේෂය තුළ නිලධාරින් විශ්‍රාම ලබා වර්ෂ 2 ක් ඉක්ම වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 240,545 ක් වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමඟ සැසදීමේදී රු.195,525 ක වෙනසක් අනාවරණය විය.

(ඇ) **ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම්**

**---------------------------------**

ඇවර කිරීමේ ගිණුමකට අදාල අනුමත නොකළ සමුච්චිත කාරක පාඩු එකතුව රු.8,236,453 ක් වී තිබූ අතර එය කපාහැරීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

5.4 **යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

-------------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර, දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ

අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කර තිබුණත්, එමගින්ද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ආවරණය කර නොතිබුණි.

5.5 **ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

-------------------------------------------

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---------------------------------------------

දෙපාර්තමේන්තුවට අයත් නුවරඑළිය පේෂකර්මාන්ත පුහුණු පාසලේ ගොඩනැගිල්ලේ ව්‍යාපෘති කාර්යාලයක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.2,500,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

5.6 **කාර්යසාධනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පේෂ කර්මාන්ත පුහුණු පාසල් සඳහා සිසුන් බඳවා ගැනීම**

---------------------------------------------------------------------

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටුවා ඇති පේෂ කර්මාන්ත පාසල්වලින් වාර්ෂිකව නොමිලේ ක්‍රියාත්මක කරන පාඨමාලා දෙකක් මගින් අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ අංග සම්පූර්ණ දැනුමක් හා පුහුණුවක් ලබාදීමෙන් පේෂ කර්මාන්තයට අවශ්‍ය කළමනාකරුවන්, උපදේශකයින් සහ ව්‍යවසායකයින් බිහි කිරීම අරමුණු කර ගෙන තිබුණි. පේෂ කර්මාන්තය පිළිබඳ මූලික අධ්‍යාපනයක් ලබා දෙන සය මාසික මූලික පාඨමාලාව සඳහා කිසිදු ශිෂ්‍යයෙකු සමාලෝචිත වර්ෂයේදී ඇතුළත් කර ගෙන නොතිබු අතර අවසාන සහතික පත්‍ර එක් අවුරුදු පාඨමාලාව සඳහා සිසුන් 200 දෙනෙකු බඳවා ගැනීමට සැලැසුම් කර තිබුණත්, සිසුන් 142 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි.

(ආ) **මෝස්තර පුහුණු පාසල් සඳහා සිසුන් බඳවා ගැනීම**

--------------------------------------------------------

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත වන පරිදි දේශීය හා විදේශීය වෙළඳපොළ ක්‍රියාකාරීත්වය ජය ගැනිමට හැකි වන පරිදි අත් යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලී සහ තරඟකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වේ. එම අරමුණ සාක්ෂාත් කර ගැනිමට මෝස්තර නිර්මාණකරුවන් පුහුණු කිරීම සඳහා නේවාසික එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් ගැටඹේ හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසල් මගින් පවත්වා තිබුණි. 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 50 බැගින් පාසල් දෙක සඳහා සිසුන් 100

දෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂා කළද ගැටඹේ හා කටුබැද්ද මෝස්තර පුහුණු මධ්‍යස්ථානය සඳහා පිළිවෙලින් සිසුන් 13 ක් හා 11 ක් වශයෙන් එකතුව සිසුන් 24 දෙනෙකු පමණක් ඇතුළත් වී තිබුණි. එය ඉලක්කගත සිසුන් සංඛ්‍යාවෙන් සියයට 24 ක් පමණක් විය. මේ පිළිබඳව කළමනාකරණයේ විශේෂ අවධානය යොමු විය යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

5.7 **කළමනාකරණ දුර්වලතා**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **බදු දී ඇති ඉඩම්**

**----------------**

බදු දී ඇති ඉඩම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී අදාල ඉඩම් සම්බන්ධයෙන් 1995 ජුලි 21 දිනැති අංක SEI/A/4/34 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව කටයුතු කර තිබුණු අතර, පහත සඳහන් ඉඩම්වලින් අයකර ගත යුතු රු.19,893,884 ක් වූ හිඟ හිටි බදු මුදල් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි

| බලවේග ව්‍යාපාරය/ඉඩම | අයකර නොගත් බදු මුදල |
|---|---|
| | රු. |
| තෙල්දෙනිය | 2,522,000 |
| කළුතර | 1,991,962 |
| බේරුවල | 2,151,319 |
| තලාතු ඔය | 4,368,000 |
| යටිනුවර | 312,795 |
| කුරුවිට | 5,491,690 |
| බිබිල | 1,681,250 |
| හිඟුරක්ගොඩ | 529,600 |
| බණ්ඩාරවෙල | 845,268 |
| එකතුව | 19,893,884 |

**(ආ) අක්‍රීය පේෂ පාසල්**

--------------------

සිසුන් බඳවා ගැනීමට හා රඳවා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම නිසා කහවත්තේ පිහිටි හිරමඩගම හා නුවරඑළියේ පිහිටි ශාන්තිපුර යන පේෂ පාසල් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

**(ඇ) වන්දි මුදල් ගෙවීම**

-------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පෙහෙකම්හල් ඇවර කොට වසර 34 ක් ගත වී තිබුණත්, වන්දිලාභීන් 3,378 ක් සඳහා එකතුව රු.149,291,000 ක් වූ වන්දි මුදල් ගෙවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී, වන්දි ගෙවීම සඳහා 2013 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ලියන ලද එකතුව රු.මිලියන 159 ක චෙක්පත් 2014 අගෝස්තු 31 දින වන විටත් වන්දිලාභීන්ට ලබාදී නොතිබූ අතර, එම චෙක්පත් 2014 අගෝස්තු 31 දිනට දෙපාර්තමේන්තු බැංකු සැසඳුමේ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් යටතේ දක්වා තිබුණි.

**(ඈ) ජල පරිභෝජනය**

------------------

දෙපාර්තමේන්තුව විසින් නියමිත දිනට පෙර ජල බිල්පත් නොගෙවීම නිසා 2013 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලයට අදාලව අධිභාර ලෙස එකතුව රු.7,429 ක් ගෙවා තිබුණි.

**(ඉ) වරිපනම් බදු ගෙවීම**

--------------------

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් එකතුව රු.12,060 ක වරෙන්තු ගාස්තු ගෙවා තිබුණි.

**(ඊ) විදුලිය පරිභෝජනය**

---------------------

දෙපාර්තමේන්තුවේ විදුලි පාරිභෝජනය සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂණයකදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පේෂ පාසල් 02 ක නේවාසිකාගාරවල විදුලි බිල්පත් ගෙවීමේ ප්‍රමාදයන් හේතුවෙන් විදුලිය සිදලීමෙන් පසු නැවත ඇමුණුම් ගාස්තු ලෙස එකතුව රු.2,400 ක් ගෙවා තිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් එකතුව රු. 5,002 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි.

(iii) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ලෙහි 4 වන මහලෙහි කොටසක් කර්මාන්ත අමාත්‍යාංශයේ ඇඟළුම් අපනයන අංශය වෙත ලබාදී තිබුණත් ඒ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයකර ගත යුතු රු. 1,025,072 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

## 5.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 04 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 109 | 99 | 10 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 42 | 25 | 17 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත්) | - | 07 | - | 07 |
| | එකතුව | 157 | 135 | 29 | 07 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 29 ක් සඳහා අදාල නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව අනියම්, තාවකාලික සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවක සංඛ්‍යාව 07 ක් විය.